# අන්තර්ජාලය සහ නූතන සන්නිවේදනය

**වචනයක් පසුපස නිර්මාණය වී ඇති මෙම අවකාශය නිසා ම කවර වෙබ් ලියැවිල්ලක හෝ අඩංගු වන අතිශ-සංවේදී වචනයකට මහත් බලයක්/ශක්තියක් ආරූඪව පවතී. එය අන්තයක් සෙවිය නොහැකි තරමට විවෘත බවක් නතු කර ගනිමින් අපට දිගින් දිගට වෙබ් අවකාශයේ රඳවා තබයි**

**බැරෑරුම් තාක්ෂණය වුවද සරල තාක්ෂණය වුවද විස්තර කිරීමේදී එය සාහිත්‍යාත්මකව හා මටසිලිටි භාෂා රටාවකින් ඉදිරිපත් කළ යුතු යැයි විශ්වාස කරන මෙම ලේඛකයා අන්තර්ජාල කටයුතු සංවර්ධන ඉංජිනේරුවෙකි.**

**ඔහු විසින් ජාතික පුස්තකාල සහ ප්‍රලේඛණ සේවා මණ්ඩලයීය ශ්‍රවනාගාරයේදී පැවැත්වූ ප්‍රසිද්ධ දේශනයක් අනුසාරයෙන් මෙම ලිපිය සැකසිති.**

## ධර්මානන්ද විජේසිංහ

නූතන සන්නිවේදන මාධ්‍යයන් අතරට එක්වූ අන්තර්ජාලය අනෙකුත් සියලු මාධ්‍යයන් අතරෙහි සුවිශේෂී හැකියාවන් ප්‍රදර්ශනය කරමින් විශ්ව ව්‍යාප්තව ශක්තිමත් වෙමින් වර්ධනය වෙයි. මාධ්‍ය ක්ෂේත්‍රය තුළ තමන්ට අයිති ඉඩ ප්‍රමාණය හා සීමාවන් නිශ්චිත කර ගනිමින් ද, එම සීමාවන් ක්‍රමයෙන් පුළුල් කර ගනිමින් ද, සෙමෙන් එහෙත් ශක්තිමත්ව සියළු රටවල ජන සමාජයන් අතර මනා පාදක ව්‍යූහයක් බිහි කර ගනිමින් ද මෙම "විශ්ව ජාලය" තම ගමන් මගෙහි ඉදිරියට ම පිය නගයි.

මෙම ඉදිරි පියවරයන් සාර්ථක වීමට ප්‍රධානතම හේතුව වී ඇත්තේ පරිගණක තාක්ෂණය, ජාල තාක්ෂණ සහ සන්නිවේදන ක්‍රම වේදයන්හි වේගවත් දියුණුව යි.

එවන් තාක්ෂණ ජයග්‍රහණයන්හි ප්‍රතිඵල අනෙකුත් මාධ්‍යයන් කරා ද ඇදී ගොස් ඒවායේ ක්‍රියාකාරකම් ද වඩාත් වර්ධිත තත්ත්වයකට පත් නොකරන්නේ නොවේ. එහෙත් ඒවායේ වර්ධන වේගයට වඩා වැඩි ශීඝ්‍රතාවකින් අන්තර්ජාල මාධ්‍ය ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් පරිණත වෙමින් පවතී.

නූතන ජගත් සන්නිවේදන කටයුතුවලට සාපේක්ෂව මෙය ඉතාමත් යහපත් තත්ත්වයකි. මෙම ජයග්‍රහණ ප්‍රතිඵලවල ඇති අනන්‍යභාවය නිසාම අනෙකුත් මාධ්‍යයන් අභිභවා අන්තර්ජාලයට හිස එසවීමට ඇති හැකියාව නොයෙකුත් ඉසවු ඔස්සේ අපට දක ගත හැකිවෙයි.

ජාලයේ භාවිත කරන සන්නිවේදනාංග (Communicatve Elements) පහක් ගැන අපි පසුගිය ලිපියේදී සාකච්ඡා කළෙමු. මෙම සන්නිවේදනාංග පහ ජාලය තුළ ගොනු කෙරෙන්නේ වෙබ් පිටු ආකාරයෙන් වන අතර වෙබ් පිටු තුළ සියල්ල හැසිරවීම (HTML)නම් වූ භාෂාව භාවිතයෙන් සිදු කෙරෙයි.

මෙම අතිශ-සංවේදී භාෂාව (Hyper Language) මුද්‍රිත ස්වරූපයේ සන්නිවේදනාංගවලට වඩා බොහෝ වෙනස්කම් දක්ෂකම් සහිත භාෂාවකි.

## වචනයක අවකාශයීය බව

අතිශ-සංවේදී පාඨවලට අන්තයක් නැතැයි සැලකේ. (Hyper text has no end) මුද්‍රිත පුවත්පතක්, පොතක්, කවර ලියවිල්ලක් හෝ සලකමු. ඒවායේ වචනවල සීමිත බවක්, සංවෘත බවක් අන්තයක්, අවසාන වූ බවක් අපට අත් විඳිය හැකිවෙයි. එනම් මුද්‍රිත වචනවලින් පාඨවලින් (printed text) පිටුපසෙහි නැතහොත් ඉන් ඔබ්බෙහි තවත් පාඨ අපට ලබන්නට, දකින්නට නොහැකි වෙයි. එනම් මුද්‍රිත පාඨය යනු එය පමණි. (මෙහි සාපේක්ෂක වෙනස තේරුම් යන්නේ අතිශ-සංවේදී පාඨවල ස්වභාවය මුද්‍රිත පාඨයේ ස්වභාවය සමග සසඳා බැලීමෙනි)

යම් මුද්‍රිතාංගයක පිටු සංඛ්‍යාව ගැන සැලකුව ද එහි යම් සීමිත බවක් වෙයි. එනම් පිටු 24ක පුවත්පතක පිටු 24න් පිටු සංඛ්‍යාව අවසන් වෙයි. පිටු 150 ක පොතක 150 වන පිටුවෙන් අවසානය දැකිය හැකිවෙයි. මුද්‍රිතාංගයක සීමාසහිත බව , සංවෘත භාවය අපට ස්වරූප ලෙසින් හඳුනා ගත හැකි වන්නේ එලෙසිනි.

මෙය වෙනත් අයුරකට කිවහොත් , මුද්‍රිත පිටුවක ඇති පාඨයන් එම මුද්‍රිත පිටුවට සීමාසහිත වීම යන්නෙන් අදහස් කරන්නේ එම මුද්‍රිත පිටුවට ඔබ්බෙන් වූ අවකාශයක ඇති බලයක් මුද්‍රිත පාඨයකට (printed text) නැති බව යි.

එහෙත් අතිශ-සංවේදී පාඨයන්හ (Hyper text) ස්වභාවය මෙයට ඉඳුරාම වෙනස් වෙයි. එහිදී අපට සංවෘත බවක්, සීමාසහිත බවක් දැකිය නොහැකි වෙයි. අතිශ-සංවේදී පාඨයක් වචනයක් පසුපස තවත් පාඨ අඩංගු වෙබ් පිටුවක්, එය පසුපස තවත් වෙබ් පිටුවක්, එය පසුපස තවත් වෙබ් පිටුවක් ආදී වශයෙන් වූ වෙබ් පිටු ගණනාවක් විශාල අවකාශයක් ඔස්සේ පැතිර තිබෙයි.

වචනයක් පසුපස නිර්මාණය වී ඇති මෙම අවකාශය නිසා ම කවර වෙබ් ලියැවිල්ලක හෝ අඩංගු වන අතිශ-සංවේදී වචනයකට (Hyper word) මහත් බලයක්/ශක්තියක් ආරූඪව පවතී. එය අන්තයක් සෙවිය නොහැකි තරමට විවෘත බවක් නතු කර ගනී. එක අතිශ-සංවේදී වචනයකින් තවත් පාඨ ගණනාවකට හා එයින් තවත් එහාට, එයින් තවත් එහාට ආදී වශයෙන් අපට දිගින් දිගට වෙබ් අවකාශයේ web space රඳන්නට හැකියාව ලැබෙයි.

## නව්‍ය වූ රචනා සංස්කෘතිය

එය අතිශ-සංවේදී පාඨවලට පමණක් ඇති සුවිශේෂී වූ හැකියාවකි. මේ ඔස්සේ නව්‍ය වූ රචනා සංස්කෘතියක් ද නව්‍ය වූ කියවීම් සංස්කෘතියක් ද ගොඩ නැගෙමින් පවතී.

අතිශ-සංවේදී ලියැවිල්ලක් (Hyper Document) කියවීමේදී විවෘත බවක්, අසීමාන්තික අවකාශයක සැරිසැරීමේ හැකියාවක් අපට ලැබෙයි. එය කියවීම් ක්‍රමවල නව ආරකි. වඩාත් පහසු පිටු පෙරලීමක් වඩාත් පහසුවෙන් පිටු අතර යාත්‍රා කිරීමේ හැකියාවක් ද අතිශ-සංවේදී ලියවිලි අපට ලබා දෙයි.

මෙම පහසු කියවීම් ස්වරූපය නිතර නිතර භාවිතා කරන අයකුට මුද්‍රිතාංග කියවීමේදී යම් අපහසු බවක් , සීමාකාරී බවක් යම් රාමුවක් තුළට කොටු වූ බවක් හැඟීම ස්වභාවික ය.

සෑම දෙය ම ක්ෂණික වෙමින් පවතින වර්තමානයේ තමන් කියවන පොතක හෝ පුවත්පතක හෝ පිටුවක් පෙරළන්නට තරම් වත් කාලයක් අපට නැතැයි යන හැඟීමක් අප සිත් තුළට කාන්දුවෙමින් පවතිනවා නේද? මෙය වැරදි හැඟීමක් විය හැකි ය.

කෙසේ වුවත් භෞතිකව මුද්‍රිතාංගයක පිටු පෙරළන්නට යන කාලය, කාලය අපතේ යැවීමක් ලෙස අපට හැඟෙන්නට පටන් ගනිමින් තිබේ.

පහසුවෙන් එහා මෙහා සොලවන මවුසයේ ක්ලික් එකක් මගින් පිටු පෙරළන ක්‍රමයට අප හුරුවන විට, එනම් පහසු වෙබ් කියවීම් සංස්කෘතියකට (Web reading culture) අප හුරුවන්නට හුරුවන්නට, මේ හැඟීම තව තවත් අප සිත් තුළ තහවුරු වීම අනිවාර්ය වනු ඇත.

## සෙවුම් හැකියාව

අතිශ-සංවේදී පාඨ සහ මුද්‍රිත පාඨ අතර ඇති අනෙක් වැදගත් ම වෙනස වනුයේ 'සෙවීම් (search) හැකියාව යි. මුද්‍රිතාංගයක අඩංගු වචනයකට අදාළ වන හෝ සම්බන්ධතාවක් ඇති හෝ වෙනත් වචන සොයා ගැනීමට පහසුකම් මුද්‍රිතාංගය තුළ ඇති කළ නොහැක.

එහෙත් වෙබ් ලියවිල්ලකweb document ඇති වචනයක අරුතක් හෝ ඒ හා බැඳුනු වෙනත් වචන හෝ ඒ වචනය, අදාළ සන්දර්භය තුළ අරුත් ගැන්වෙන්නේ කවරාකාරයෙන්ද යන්න හෝ ඒ වචනයට අදාළ වන පරිවාර කරුණක් සම්බන්ධ විස්තර හෝ යන මේ සියල්ලම හෝ එකට ගොනු කොට බැඳීම් Links ලබාදීමේ හැකියාව අතිශ-සංවේදී වචන සතු වෙයි.

එම බැඳීම් Links ඔස්සේ ඊළඟ පිටුවලට අපට පැනිය හැකි වෙයි .(Hops) මෙය රචනා ක්‍රමයන් හි ප්‍රසාරණය ලෙස මෙන්ම නව රචනා ශෛලියක් new writing style සහ නව ඉදිරිපත් කිරීමේ ශෛලියක් new presentation style ද වේ.

මේ සියළු භාෂාමය හා රචනාමය පහසුකම් අපට ලැබෙන්නේ වෙබ් තාක්ෂණයේ මහිමය සහ HTMLභාෂාවේ ක්‍රමානුකූල සහ සංවිධිත වර්ධනය නිසා ම ය.

## ජීව ගුණය

මුද්‍රිතාංගයක් හා වෙබ් ලියැවිල්ලක් අතර ඇති ඊළඟ වෙනස්කම නම් ජීව ගුණය යි. මුද්‍රණය කරන ලද ලියැවිල්ලක් එතැන් පටන් එලෙසින් ම පවතී. යම් වෙනසක් සංස්කරණයක් අවශ්‍ය වෙතොත් එය නැවත මුද්‍රණයක් ම විය යුතු ය. මුද්‍රිතාංගයට දෘඩ පිටපතක් (hard copy) වන බැවින් අමුද්‍රව්‍ය භාවිතා කොට කෙරන උපකරණමය ක්‍රියාවලියන් ඔස්සේ දෙවන මුද්‍රණය ලබාගත යුතු ය.

වෙබ් පිටුව ඊට හාත්පසින් ම වෙනස් වෙයි. පරිගණක සන්නිවේදනාංගයක් (computer communicative elemnt එකක් වන එය මෘදු පිටපතක් (soft copy වන අතර ජාලය තුළ ඇති වෙබ් ලියැවිල්ලක් එහි අයිතිකරුට තමා සිතූ සැනින් සංස්කරණය කළ හැකි වෙයි.

මෙය විස්මය ජනක හැකියාවක් නොවන්නේ ද? වෙබ් ලියැවිල්ල නැවත සංස්කරණය කර පෙර තිබූ ලිපිනයට ම (same web address / URL) ජාලගත කළ විට, පෙරදී තිබූ අතිශ-සංවේදී සබඳතා එලෙසින් ම ක්‍රියාත්මක වෙමින් නව ලියැවිල්ල ජාලයේ සැරිසරන හැකියාව අත්පත් කර ගනී.

## මෘදු පිටපතක විශේෂත්වය

මොහොතකට පෙර අන්තර්ජාලයෙන් කියවූ වෙබ් පිටුවක නව සංස්කරණයක්, ඊළඟ මොහොතේ අපට ජාලය ඔස්සේ ලැබෙන්නට ඇති ඉඩකඩ බොහෝසෙයින් පුළුල් වෙමින් පවතී. අලුත් තොරතුරු එකතු කිරීමට සහ තම ලියැවිල්ලක වඩාත් සුමට සංස්කරණයක් පහසුවෙන් කිරීමට ඇති හැකියාව ජාල පුවත්වේදීන්ගේ (Web journalists) සහ ජාල පුවත් සංස්කාරකවරුන්ගේ (web editors) දෝතට පිරිනැමීමට නවතාක්ෂණ වර්ධනයන් සමත් වී ඇත. ජාලයේ මෙලෙසින් සිදු කළ හැකි මෘදු පිටපත් සංස්කරණයේsoft copy editing හැකියාව කොතරම් පහසු, කොතරම් වේගවත් , කොතරම් සරල ක්‍රියාවක් ද යත් , දක්ෂ ලෙස පවත්වාගෙන යන ජාල පුවත්පතකට එක් දිනක් තුළ සංස්කරණ online edition ගණනාවක් ජාලගත කළ හැකි වෙයි.

ඒ ජාල පුවත්පත බලන ග්‍රාහකයා හැමවිටම අලුත්ම පුවත් ලබා ගැනීමේ වාසනාව හිමි තැනැත්තකු බවට පත් වෙයි. අලුත් පුවත් ජාලගත කිරීමේ live updates සංඛ්‍යාව වැඩි කර ගත හැකි පුවත් වෙබ් අඩවියක් අන්තර්ජාලය තුළ ජීව ගුණයෙන් ඉහළ, ග්‍රාහකයන් නිතර බැඳී සිටින, ඉහළ වාණිජමය ශක්‍යතාවන් අත්පත් කර ගත්, ශක්තිමත් වෙබ් අඩවියක් වීම කිසිවකුට වැළැක්විය නොහැකි වෙයි.

මෙතරම් විශිෂ්ඨ වූ හැකියාවන් දක්ෂතාවන් ජාලතාක්ෂණ මෙවලම් ඔස්සේ අපට ලබාගත හැකිවුවද දේශීය වශයෙන් අප ඒ අයුරින් ක්‍රියාත්මක වන්නේද යන්න සැක සහිත කාරණයකි.

ජාලය තුළ කළ හැකිවූ ක්‍රියාකාරකම් ගැන අපට නිසියාකාර අවබෝධයක් නොමැති වීම, කළ යුතු දෙය පිළිබඳ නිසි දැක්මක් නොමැතිවීම, සංවිධානමය හැකියාවෙන් තොරවීම සහ පුවත්-වෙබ් අඩවි පවත්වාගෙන යන දේශීය ආයතනවල ඇති පරිපාලනමය දුර්වලතා නිසා ද මේ තත්ත්වය උද්ගතව තිබේ.

බොහොමයක් ලාංකීය පුවත් වෙබ් අඩවි තාක්ෂණමය වශයෙන් හෝ මාධ්‍යමය වශයෙන් ඒවාට යා හැකි දුරෙන් අඩක්වත් තවම ගමන්කොට නැතියැයි කීම සත්‍යයෙන් දුර කියමනක් නොවේ. ❑

